**අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල - 2017**

---

අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2009 අංක 44 දරන අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල් පනතේ 10(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ හා ආදායම් වියදම් ගිණුමේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොටගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා පදනම් කරගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති (ක්ෂය ප්‍රතිපත්තිය හැර) අනාවරණය කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දරන ලද රු.3,881,861 ක් වූ ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් අයහාර වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දේපල පිරියත උපකරණ වාර්ෂික ක්ෂය වටිනාකම රු.17,384,101 ක් හා ගෙවිය යුතු රු.32,600 ක අළුත්වැඩියා වියදම ආදායම් වියදම් ගිණුමට ගැලපීමට කටයුතු නොකර ශේෂ පත්‍රයේ ආයෝජන හා පරිත්‍යාග ගිණුමට ගලපා තිබුණි.

(ඇ) දුරකථන කුලුණු ආදායම මුදල් පදනම යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම රු. 1,233,500 ක් අඩුවෙන් ආදායම් වියදම් ගිණුමේ දක්වා තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ලැබිය යුතු වටිනාකම් එකතුව රු.1,277,000 ක් වුවද එම ලැබිය යුතු වටිනාකම රු.717,000 ක් අඩුවෙන් ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා සේවක අර්ථසාධක අරමුදල් වියදම රු.353,370 ක් වුවද මුදලින් ගෙවන ලද රු.326,356 ක් පමණක් ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.27,014 ක් අඩුවෙන් ආදායම් වියදම් ගිණුමේ දක්වා තිබුණි. තවද ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී ගෙවිය යුතු දායක මුදල් රු. 275,221 කින් ජංගම වගකීම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු සේවක භාරකාර අරමුදලේ දායකය රු.13,266 කින් ජංගම වගකීම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) මහා භාරකාරවරයා විසින් පවත්වාගෙන යනු ලබන ලෙජර් ගිණුම් අනුව ස්ථාවර තැන්පතුව සඳහා රු.6,004,023 ක පොලී ලැබීම් ගලපා තිබූ අතර, 2017 දෙසැම්බර් 31 දිනට මෙම අරමුදලෙන් අයවිය යුතු ලෙස දක්වා තිබූ මූලධන සහ අයහාර වියදම් පිළිවෙලින් රු.2,600,000 ක් හා රු.12,668,126 ක් වෙනුවෙන් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළ ඒ සඳහා ගැලපීම් සිදුකර නොතිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතු වටිනාකම රු.330,297,914 ක් වූ දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ලෙජර් ගිණුම්, භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබූ බැවින් විගණනයේදී සම්පූර්ණත්වය, පැවැත්ම හා වටිනාකමේ නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය.

(ආ) ජංගම නොවන වගකීම් රු.332,483,093 ක් සම්බන්ධයෙන් ලෙජර් ගිණුම් හා උපලේඛන පවත්වා නොතිබීමෙන් එහි නිවැරදිතාවය හා පැවැත්ම තහවුරු කරගත නොහැකි විය.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් පහත පරිදි විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | i. | මුදල් රෙගුලාසි 177 | සෑම ලැබීමක් වෙනුවෙන්ම කුවිතාන්සියක් නිකුත් කළ යුතු වුවද, රු.3,499,500 ක ආදායම් වෙනුවෙන් කුවිතාන්සි නිකුත් කර නොතිබුණි. |
| | ii. | මුදල්රෙගුලාසි 237 (ආ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු.167,790 ක් වටිනා ප්‍රවේශ පත්‍ර පොත් හා රු.40,000 ක් වටිනා වතුර පොම්පයක් තොග ලේඛනයේ සටහන් කර නොතිබූ අතර, ගෙවීම් වවුචරයේ තොග සහතිකයද ඇතුළත්ව නොතිබුණි. |
| | iii. | මුදල් රෙගුලාසි 395 (ඇ) | සමාලෝචිත වර්ෂයේ එක් එක් මාසයට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. |
| | iv. | මුදල් රෙගුලාසි 446(2) | මුදල් පොත යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| | v. | මුදල් රෙගුලාසි 1645 හා 1646 | අරමුදල සතු වාහන 03 ට අදාළ ලොග් සටහන් පොත් යාවත්කාලිනව පවත්වා නොතිබූ අතර, ධාවන සටහන් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |
| (ආ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය | | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සමුච්චිත අරමුදලේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි. |

**3.**

**මූල්‍ය සමාලෝචනය**

**මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.832,468 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.218,799 ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය රු.613,669 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සියලු පහසුකම් සහිත සංචාරක නිවාස 2 ක් අරමුදල සතු වූ අතර, සමාලෝචිත වර්ෂයේ එම සංචාරක නිවාස අළුත්වැඩියාව සඳහා රු.971,783ක වියදමක් දරා තිබුණද සමාලෝචිත වර්ෂයේ එම සංචාරක නිවාසවලින් කිසිදු ආදායමක් උපයා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී අළුත්වැඩියාවන් සඳහා ගිවිසුම්ගත වීමකින් තොරව රු.1,829,757 ක් ගෙවා තිබුණ ද කොන්ත්‍රාත්කරු තෝරා ගැනීමේදී ක්‍රමවත් ක්‍රියා පරිපාටියක් අනුගමනය කර නොතිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශයේ නියමයන්ට අනුකූල නොවී මිල කැඳවීමකින් තොරව අවස්ථා 3 කදී එකතුව රු.251,226 ක ඉදිකිරීම් සඳහා අමුද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

### 4.2 හඳුනාගන්නා ලද පාඩු

ඉකුත් වර්ෂවල සේවා නියුක්ති භාර අරමුදලට ගෙවීම් කිරීම් ප්‍රමාද වීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 03 කදී රු.18,022 ක අධිභාරයක් ගෙවා තිබුණි.

### 4.3 කාර්යසාධනය

2009 අංක 44 දරන අම්බුළුවාව ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල් පනතේ 4(අ) සිට (ත) දක්වා වූ වගන්තිවල සඳහන් අරමුණු 20 න් අරමුණු 4 ක් හැරුණු විට අනෙක් අරමුණු ඉටුකිරීම සඳහා අරමුදල කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් තුළ අරමුදල් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වර්ෂ 2½ කට අධිකකාලයක් ප්‍රමාද කර 2020 දෙසැම්බර් 01 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින් වර අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ආදායම් පරිපාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) තොග පාලනය
(ඈ) වත්කම් පරිපාලනය